"ජලය මානව හිමිකමකි - සුව රැකුම අභිමානයකි"

**නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

# ලෝක බැංකු ආධාර ලබන ජල සම්පාදන සහ සනීපාරක්‍ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP)

**ණය අංක : Cr. 5685 - lk**

# ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම සඳහා ඇබෑර්තු

ලෝක බැංකු ආධාර ලබන ජල සම්පාදන සහ සනීපාරක්ෂණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) මුලතිව්, කිලිනොච්චි, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි නළ ජල සේවාවන් සඳහා ප්‍රවේශය වර්ධනය කිරීම සහ සනීපාරක්‍ෂාව වැඩිදියුණු කිරීම සහ පාතීය ජල අංශ ආයතන සංවර්ධනය කිරීම පිණිස සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතිය (නුවරඑළිය දිස්ත්‍රික්කයේ පමණක්) නාගරික, ග්‍රාමීය සහ වතු ප්‍රදේශයන් ආවරණය කරමින් ඇස්තමේන්තුගත 425,000 ක ජනතාවට සුරක්ෂිත නළ ජල සැපයුම් මගින් සෘජුව වරප්‍රසාද ලබා දෙයි. තවද, පවත්නා සමහර ග්‍රාමීය ජල සම්පාදන පද්ධති විශාලනය මගින් යෝජිත ව්‍යාපෘති අංශයන්හි සේවා බෙදාහැරීම වැඩිදියුණු කරනු ඇත.

ඒ හා සමානවම, සනීපාරක්‍ෂක වැඩසටහන, ග්‍රාමීය හා වතු ප්‍රදේශයන්හි පුද්ගලික වැසිකිළි ගැනීමට ආසන්න වශයෙන් පවුල් 43,000 කට වරප්‍රසාද ලබා දෙනු ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් නගරයේ වෙසෙන ජනතාව සඳහා සනීපාරක්‍ෂාව වැඩිදියුණු කිරීම සහ ව්‍යාපෘතියේ ප්‍රධාන අවශ්‍යතාවය වන මෙම පහසුකම් වල ජලපෝෂක ප්‍රදේශයන්හි පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම පිණිස එක් එක් දිස්ත්‍රික්කයේ උපායමාර්ගිකව පිහිටි පූතික ප්‍රතිකාරක පහසුකම් සඳහා මුදල් සපයනු ඇත.

ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMU) කොළඹ ස්ථාපනය කර ඇති අතර, දිස්ත්‍රික් ආධාරක ඒකක එක් එක් දිස්ත්‍රික්කයට එක බැගින් ස්ථාපනය කර ඇත. ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 183 කි. පහත සඳහන් පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන්ට පහත දැක්වෙන අවම සුදුසුකම් තිබිය යුතුය.

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD.ALL RIGHTS RESERVED.

## ප්‍රජා සංවර්ධන සහායක තනතුර

**(MN4 ශ්‍රේණිය III)**

**පිහිටීම** : දිස්ත්‍රික් ආධාරක ඒකක - සියලුම දිස්ත්‍රික්ක

**සුදුසුකම් හා පළපුරුද්ද :**

ශ්‍රී ලංකාව, සමාජ සංවර්ධනය පිළිබඳ ජාතික ආයතනයෙන් ලබාගත් පූර්ණ කාලීන ඩිප්ලෝමාව හෝ සමාජ විද්‍යාව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක උපාධියක් / ඩිප්ලෝමාව

සමග

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක පළපුරුද්ද

ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිවල සේවය කර ඇති අය කෙරෙහි ප්‍රමුඛතාව හිමිවේ.

**ඉහත සඳහන් තනතුර සඳහා පොදු කොන්දේසි.**

**වයස් සීමාව** : අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට අවුරුදු 18 සිට 45 අතර විය යුතුය.

**වැටුප් පරිමාණය** : වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 මත පදනම් වේ.

**සේවා රීති හා කොන්දේසි :**

පත්වීම සාර්ථක කාර්ය සාධන ඇගයීමට යටත්ව වාර්ෂිකව අලුත් කළ හැකි මූලිකව, වසර එකක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වේ. පත්වීමට අදාළව, අංක 03/2016 චක්‍රලේඛයේ සියලුම කොන්දේසි වලංගු වේ.

**තෝරාගන්නා ක්‍රමය**

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තු ගත කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කාර්ය සාධනය මත තෝරා ගැනීම් සිදු කෙරේ.

සියලුම ජීව දත්ත ඇතුළත් අයදුම්පත් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද, පෙර සේවා, සහතිකවල සියලුම පිටපත් සමග 2019 අගෝස්තු 21 වැනිදා හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය.

ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ "**අයදුම් කරන තනතුර**" සඳහන් කළ යුතුය. රාජ්‍ය / සංස්ථා අංශවල අයදුම්කරුවන් තම අයදුම්පත් තම සංවිධානයේ ප්‍රධානීන් මගින් අයදුම් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**නො. 230, ඊ. ඩබ්ලිව්. පෙරේරා මාවත,**
**ජුබිලි කණුව, නුගේගොඩ.**

Source: Dinamina, Daily News (2019.08.07)